# පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට රජයට නියම කරන්න - පැෆරල් අධිකරණයෙන් ඉල්ලයි

PAGE 4

# පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට රජයට නියම කරන්න - පැෆරල් අධිකරණයෙන් ඉල්ලයි

■ බුද්ධිමාල් රුබේරු

පළාත් පාලන ආයතන 335කට අදාළව මැතිවරණ පවත්වන ලෙස රජයට නියම කරන්නැයි ඉල්ලමින් පැෆරල් ආයතනය ඊයේ (27දා) දින ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළේය.

මෙම පළාත් පාලන ආයතන වල මැතිවරණ පැවැත්වීම රජය විසින් කල් දමන බවත් ඉන්, ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බවත් සඳහන් කරන පෙත්සම්කරු මෙම මැතිරවණය වහාම පැවැත්වීමට නියම කරන්නැයි ඉල්ලීමක් කොට ඇත. පැෆරල් සමාගම හා එහි සභාපති රෝහණ හෙට්ටිආරච්චි මහතා විසින් පවරා ඇති මෙම පෙත්සමේ වගඋත්තර කරුවන් ලෙස පළාත් පාලන හා පළාත් සභා ඇමති ෆයිසර් මුස්තාෆා, එම අමාත්‍යාංශයේ ලේකම්, සීමා නිර්ණය කිරීමේ කොමිසමේ සාමාජිකයන්, මැතිවරණ කොමසාරිස්වරයා ඇතුළු එකොළොස් දෙනෙකු මෙහි වගඋත්තරකරුවන් ලෙස නම්කොට ඇත. මේ වන විට පළාත් පාලන ආයතන 335ක ධුර කාලය අවසන් බැවින් අඩපණව ඇති බවත්, ඒවායේ සීමා නිර්ණය කරන බව දැනුම් දෙමින් එම මැතිවරණ පැවැත්වීම කල් දමා ඇති බවත් පෙත්සම්කරු විසින් දැනුම් දී ඇත.

මෙම සීමා නිර්ණ කමිටු කටයුතු වහාම අවසන්කොට පළාත් පාලන වල මන්ත්‍රී ධුර සංඛ්‍යාව ප්‍රකාශයට පත්කරන ලෙසත්, ඉන්පසු මැතිවරණ පැවැත්වීමට නියම කරන ලෙසත් පෙත්සම්කරු විසින් ඉල්ලීම්කොට ඇත.